ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීම සඳහා බදු ගෙවන්නන්ගේ මාර්ගෝපදේශ

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (**TIN**) ලබා ගැනීම 2

පුද්ගලයින් හඳුනාගැනීමේ අංකයක් (PIN) හා විශේෂිත කාර්ය මණ්ඩලය හඳුනාගැනීමේ අංක (SSID) ලබා ගැනීම 4

බදු වර්ග සඳහා ලියාපදිංචි කිරීම 5

තාවකාලික එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීම 6

බදු නියෝජිතයින් වශයෙන් ලියාපදිංචි කිරීම 7

බදු ගෙවන්නා ලියාපදිංචි කිරීමේ විස්තර යාවත්කාලීන කිරීම 8

බදු වර්ග විස්තර යාවත්කාලීන කිරීම 10

සරල කරන ලද එකතු කළ අගය මත බදු **(SVAT)** ක්‍රමය යටතේ ලියපදිංචි කිරීම 11

සරල කරන ලද එකතු කළ අගය මත බදු **(SVAT)** විස්තර යාවත්කාලීන කිරීම 14

ව්‍යාපෘති විස්තර යාවත්කාලීන කිරීම 15

www.ird.gov.lk

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (TIN) ලබා ගැනීම

බදුගෙවීම සඳහා / ආනයනය අපනයනය සඳහා / ව්‍යාපෘතියක් ලියාපදිංචි කිරීම සඳහා හෝ වෙනත් සේවාවන් ලබා ගැනීම සඳහා බදු ගෙවන්නා හඳුනාගැනීමේ (TIN) අංකයක් යටතේ ප්‍රථමයෙන් ලියාපදිංචිය විය යුතුය. අයඳුම්කරන්නාගේ අවශ්‍යතාවය අනුව හා ඔවුන්ගේ බදු බැඳියාව අනුව TIN අංකය ලබා ගැනීමෙන් පසු අදාල කාර්යයන් සඳහා ලියාපදිංචි කිරීමට ඔවුන් කටයුතු කල යුතුය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාව භාවිතා කරමින් බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගත හැකිය. ඊ- සේවා තීරය වෙත පිවිසීමට "බදු ගෙවන්නෙකු ලෙස ලියාපදිංචි වන්නේ කෙසේද" ('How to register as a Taxpayer') යන විස්තරාත්මක ඉක්මන් උපදෙස් වෙත යොමු වන්න.

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීම සඳහා අවශ්‍යවන්නාවූ උපකාරක ලිපිලේඛන

තනි පුද්ගලයින් සඳහා

- ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලංකිකයින්) / වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය (තනි අයිතිකරුවෙක් නම් ඒ බව බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය සඳහා ඇතුළත් කළ යුතුය.)
- උපයෝගීතා බිල්පත/බැංකු ගිණුම් ප්‍රකාශ හෝ පාස් පොත/ග්‍රාම නිලධාරි සහතිකය (ලිපිනය ජාතික හැඳුනුම්පතේ ලිපිනය හා වෙනස් වේ නම්). විදේශිකයන් සඳහා, ශ්‍රී ලංකා ලිපින සාක්ෂි අවශ්‍ය වේ.

හවුල් ව්‍යාපාර සඳහා

- හවුල් ව්‍යාපාර ලියාපදිංචි සහතිකය
- සියළුම හවුල්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලාංකිකයින් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින් සඳහා)

ලියාපදිංචි සමාගම් සඳහා (පුද්ගලික සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, ලියාපදංචි විදේශ සමාගම්, සීමිත සමාගම්, සිමා රහිත සමාගම්, අක්වෙරළ සමාගම්)

- සංස්ථාගත කිරීමේ සහතිකය (ආකෘති පත්‍ර 2A/2D/42/41 යනාදිය)
- සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද ආකෘති පත්‍ර 01/05/40 යනාදිය
- සියළුම අධ්‍යක්ෂවරුන්ගේ ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලංකිකයන් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශීය ජතිකයින් සඳහා)
- සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද ආකෘති පත්‍ර 20 යනාදිය
- සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද ආකෘති පත්‍ර 13/35 යනාදිය
- අධ්‍යක්ෂකගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ සහතනිකය (ආකෘති පත්‍ර 18 - අධ්‍යක්ෂවරයාගේ අත්සන හඳුනාගැනිමට පමණක් ආකෘති පත්‍ර 20 ලබා ගන්නා විට අදාල වේ.
- සාංගමික ව්‍යවස්ථාවලිය
- ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සහතිකය සහ ගිවිසුම

For further details call IRD Call Centre on 1944

www.ird.gov.lk

අනෙකුත් ආයතන

- ආයතන ප්‍රධානියාගේ අයදුම් කිරීමේ ලිපිය
- ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලාංකිකයින් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්) සහ පත් කිරීමේ ලිපිය/අත්සන සහතික කරන්නාගේ ලිපිය
- වාර්ෂික මහා සභා රැස්වීම් සටහන්/විධායක වාර්තාව (අදාල වේ නම්)
- ලියාපදිංචි කිරීමේ සහතිකය
- ප්‍රධාන කාර්යාලය විසින් නිකුත් කරන ලද ශාඛාව සහතික කිරීම (ශාඛා සඳහා පමණි.)
- ආයතනය ස්ථාපිත කිරීමේ පනත/ගැසට් පත්‍රය (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා පමණි.)
- බද්ධ ව්‍යාපාර ගිවිසුම් හා හවුල්කරුවන්ගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකවල පිටපත් (බද්ධ ව්‍යාපාර සඳහා පමණි.)
- අත්සන් තබන්නා සඳහා ඇටෝර්නි බලකරු (ගිවිසුමේ ඇතුළත් කර නොමැති නම් පමණක් බද්ධ ව්‍යපාර සඳහා)
- ව්‍යාපෘති ගිවිසුම හා කැබිනට් අනුමැතිය (ව්‍යපෘති සඳහා පමණි.)
- භාර ඔප්පුව (ඒකක භාර සඳහා පමණි)

www.ird.gov.lk

පුද්ගලයින් හඳුනාගැනීමේ අංකයක් (PIN) හා විශේෂිත කාර්ය මණ්ඩලය හඳුනාගැනීමේ අංක (SSID) ලබා ගැනීම

පුද්ගලයින් හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාවන් වෙත ප්‍රවේශ වීමට අත්‍යවශ්‍ය වන අතර, එය ඊ- සේවා ද්වාරය මඟින් ලබා ගත හැක.

ඊ-සේවා තීරය වෙත පිවිසීමට "ඊ-සේවාව භාවිතා කිරීම සඳහා පුද්ගලයින් හඳුනා ගැනීමේ අංකය භාවිතා කරන්නේ කෙසේද යන්න" ('How to obtain a PIN to use e-Service') විස්තරාත්මක ඉක්මන් උපදෙස් වෙත යොමු වන්න.

PIN අංකය උත්පාදනය කර ඔබගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට වහාම යවනු ලැබේ. ඔබට PIN අංකය තැපැල් ප්‍රකාරය හරහා ලබා ගැනීමටද තෝරා ගත හැක.

සමාගම්වලට හා බදු නියෝජිතයින්ට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ-සේවාව වෙත පිවිසීමට විශේෂිත කාර්ය මණ්ඩල හඳුනාගැනීමේ අංක අත්‍යාවශ්‍යය.

පුද්ගල හැඳුනුම් අංකයක් ලබා ගත් පසුව, ඔවුන්ගේ කාර්යමණ්ඩලයට ඇතුලත් වීමට ඉඩදීම සඳහා ඊ - සේවා ද්වාරයේ කාර්යාල මණ්ඩලයට බලය දීම/ බදු නියෝජිත සම්බන්ධතාව ඉල්ලුම් කිරීමට විශේෂිත කාර්ය මණ්ඩල හඳුනා ගැනීමේ අංකය අවශ්‍යය.

ඊ-සේවා තීරය වෙත පිවීසිමට "බලය ලත් කාර්ය මණ්ඩලය හෝ බාහිර බදු නියෝජිතයින් ඔබ වෙනුවෙන් කටයුතු කරන්නේ කෙසේද යන්න" ('How to authorize staff or external tax agents to act on your behalf') විස්තරාත්මකව ඉක්මන් උපදෙස් පරිශීලනය කරන්න.

එක් එක් බදු වර්ග සඳහා පිළියෙල කරන්නන් හා අනුමත කරන්නන් වශයෙන් කාර්ය මණ්ඩලය සඳහා බලය ලබාදීමට පුළුවන.

SSID උත්පාදනය කර ඔබගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට ඊළඟ වැඩ කරන දිනයේ යවනු ලැබේ.

www.ird.gov.lk

බදු වර්ග සඳහා ලියාපදිංචි කිරීම

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගත පසුව එක් එක් බදු ගෙවන්නාට අදාල වන බදු සඳහා ලියාපදිංචි වීම අත්‍යාවශ්‍ය වන අතර, එම කාර්යට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාවන් භාවිතා කරමින් කළ හැකිය.

බදු වර්ග සඳහා ලියාපදිංචි විය හැකි පුද්ගලයින්

- ආදායම් බද්ද - වගකීම් සීමාවට ඉහළින් ඇති ආදායම මත පදනම්ව වාර්තා ඉදිරිපත් කිරීමට බැඳී සිටින අය
- එකතු කළ අගය මත බද්ද (VAT) - සීමාව ඉක්මවා හෝ ස්වේච්ඡා පදනමින් බදු අය කළ හැකි සැපයුම් ඇති අය
- වෙනත් බදු වර්ග - ලියාපදිංචි වීමට බැඳී සිටින අය

ඊ - සේවා තීරය වෙත ප්‍රවේශවීමට "බදු වර්ග සඳහා ලියාපදිංචි වන්නේ කෙසේද' ('How to Register for a Tax Type') යන විස්තරාත්මක ඉක්මන් උපදෙස් බලන්න.

සමාගම් සඳහා, TIN ලබාගත් පසු, ආදායම් බදු (CIT) ස්වයංක්‍රීයව ලියාපදිංචි වේ.

එකතු කළ අගය මත නොවන බදු වර්ග සඳහා උපකාරක ලිපි ලේඛන අවශ්‍ය නොවේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාවන් හරහා අයදුම් කරන්නේ නැත්නම් සියළුම බදු වර්ග සඳහා බදු වර්ග ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය TPR 005 E අවශ්‍ය වේ.

ඊ- මේල් ලිපිනය හා ජංගම දුරකතන අංකය ඇතුළුව බදු ගෙවන්නාගේ ලියාපදිංචි විස්තර යම් යාවත්කාලීන කිරීමකට අවශ්‍ය වන අවස්ථාවක දී, එම විස්තර ස්ථිර එකතු කළ අගය මත බදු ඇතුළුව ඕනෑම/සියළුම බදු වර්ගය (වර්ග) ක් සඳහා අයදුම් කිරීමට පෙර යාවත්කාලීන කළයුතුය.

ස්ථිර එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය වන්නාවූ උපකාරක ලිපි ලේඛන

- ව්‍යාපාරයේ දී බදු අයකළ හැකි සැපයුම සහතික කිරීම සනාථ කිරීමේ ලිපි ලේඛන (විකුණුම් ඉන්වොයිසිය/විකිණීමේ ගිවිසුම/බැංකු ප්‍රකාශ/කුලී ගිවිසුම/ගුවන් ගත කිරීමේ ලේඛනය/නෞභාර පත්‍රය/වාණිජ ඉන්වොයිසය/බැංකු පිටපත්
- තේ මණ්ඩලයල,පොල් වගා කිරීමේ මණ්ඩලය,මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යනාදිය මගින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය
- ස්වේච්ඡාවෙන්ම ලියාපදිංචි අවස්ථාවක් වන විට ලියාපදිංචි වීමේ අරමුණ සඳහන් කළ යුතුය.
- 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22(7) වගන්තිය යටතේ/විශේෂ ව්‍යාපෘති/ක්‍රමෝපාය සංවර්ධන ව්‍යෘපාති යටතේ ලියාපදිංචි වන අවස්ථාවක දී, කරුණාකර වගන්තිය පහතින් සඳහන් කරන්න.
- VAT සහතිකය ලබා ගැනීමට බලයලත් පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත

For further details call IRD Call Centre on 1944

www.ird.gov.lk

තාවකාලික එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීම

රේගුව හරහා සිදුවන භාණ්ඩ ආනයනය , අපනයනය හා ප්‍රතිඅපනයනය ක්‍රියාවලියෙහි යෙදෙන පුද්ගලයන් එ.අ.බ. යටතේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. ස්ථිර ලියාපදිංචි නොමැති තැනැත්තන් සඳහා තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිතුක් කරනු ඇත. එම ලියාපදිංචිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාවන් භාවිතයෙන් කළ හැකිය.

ඊ- මේල් ලිපිනය හා ජංගම දුරකතන අංකය ඇතුළුව බදු ගෙවන්නාගේ ලියාපදිංචි විස්තරවල යම් යාවත්කාලීන කිරීමක් අවශ්‍ය වූ විට, එම විස්තර තාවකාලික ලියාපදිංචි කිරීමට පෙර යාවත්කාලීන කළ යුතුය.

ස්ථිර එ.අ.බ. ලියාපදිංචියක් නොමැති ආනයනය හා අපනයනය කරන්නන්. පහත සඳහන් කාර්යයන් වල යෙදෙන අයට ලබා දෙන ලද තාවකාලික ලියාපදිංචි අංකය කොමාසාරිස් ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු අංක CGIR/2020/2-2 හා 2020.11.23 දින දරණ ලිපිය මඟින් එ.අ.බ. පනත අනුව අවශ්‍ය නොවන බවට දන්වා ඇත.

- රේගු නිෂ්කාශණ හා ඉදිරිපත් කිරීමේ කටයුතු වල යෙදෙන්නන්
- නෞකා ඒජන්තවරුන් හා උප ඒජන්තවරුන්
- නිෂ්කාශණ නියෝජිතායතන හා වාප්පු නියෝජිතයන්
- ආනයන හා අපනයන කටයුතු වල නිරත ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතන (BOI)
- කැටුව නොඑන ගමන් බඩු ගුදම් ක්‍රියාකරුවන්
- කූරියර් සේවා නියෝජිතයින්

තාවකාලික එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය උපකාරක ලිපි ලේඛන

- ආනයනය සඳහා - ඉන්වොයිස් පත්‍රය සහ නෞභාර පත්‍රය / ගුවන්ගත කිරීමේ ලේඛනය
- අපනයනය සඳහා - පිටරට ගැනුම්කරුවන්ගෙන් ලැබුණු සහ ගිවිසුම් තිබේනම්

www.ird.gov.lk

බදු නියෝජිතයින් වශයෙන් ලියාපදිංචි කිරීම

දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගත්, තවද පහත දැක්වෙන අවශ්‍යතාවයන්ගෙන් එකක් හෝ සම්පූර්ණ කර ඇති තනි හවුල් ව්‍යාපාර හා පුද්ගලයින් හට බදු නියෝජිතයින් වශයෙන් අයදුම් කළ හැකිය. PAYE සඳහා වගකිව යුතු සමාගමට PAYE සඳහා පමණක් බදු නියෝජිතයන් ලෙස ක්‍රියා කළ හැකිය.

- නීතීඥයකු
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සමාජිකයෙකු වීම
- ශ්‍රී ලංකා බදු කරණ කාර්යායතනයේ සමාජිකයෙකු වීම
- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද තැනැත්තෙකු හා සමාගම් (විගණකවරු) නියාමනයන් යටතේ විගණකවරයෙකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තෙකු
- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද වෙනත් ඕනෑම වර්ගයක තැනැත්තෙකු

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ- සේවාව භාවිතා කරමින් බදු නියෝජිතයින් ලෙස ලියාපදිංචි විය හැකිය. ඊ - සේවා තීරය වෙත පිවිසීමට "බදු නියෝජිතයකු ලෙස ලියාපදිංචි වන්නේ කෙසේද" ('How to register as a tax agent') යන විස්තරාත්මක ඉක්මන් උපදෙස් වෙත යොමු වන්න.

බදු නියෝජිතයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය උපකාරක ලිපි ලේඛන

- ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලාංකිකයින් සඳහා) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- බදු නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය වලංගු සුදුසුකම් සනාථ කිරීමේ ලිපි ලේඛන (2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 212 සහ 217 වගන්ති යටතේ 2006 අංක 01 දරන බලයලත් නියෝජිත රෙගුලාසි)

www.ird.gov.lk

බදු ගෙවන්නා ලියාපදිංචි කිරීමේ විස්තර යාවත්කාලීන කිරීම

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගත් පසුව, එක් එක් බදු ගෙවන්නා සඳහා ලියාපදිංචි විස්තර නොකඩවා හා නිවැරදිව යාවත්කාලීන කිරීම අත්‍යාවශ්‍ය වන අතර, එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාවන් භාවිතා කිරීමෙන් කළ හැකිය.

ඊ - සේවාවන් වෙත ප්‍රවේශවීමට "බදු ගෙවන්නාගේ ලිපි ගොනු තොරතුරු වෙනස් වන්නේ කෙසේද යන්න"'How to change Taxpayer Profile Information' විස්තරාත්මක ඉක්මන් උපදෙස් බලන්න

බදු ගෙවන්නා ලියාපදිංචි කිරීමේ විස්තර යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන උපකාරක ලිපි ලේඛන

තනි පුද්ගලයින් සඳහා

- ජාතික හඳුනුම්පත (ශ්‍රී ලංකිකයින්)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය (හිමිකාරිත්වය පිළිබඳ දත්ත එකතු කිරීමට/යාවත්කාලීන කිරීමට අවශ්‍ය නම්)
- උපයෝගීතා බිල්පත/ස්ථාවර දුරකතන බිල්පත/බැංකු ගිණුම් ප්‍රකාශය හෝ පාස් පොත/ග්‍රාම නිලධාරි සහතිකය (ජාතික හැඳුනුම්පතේ ලිපිනය සමඟ වෙනස් වන්නේ නම්)

හවුල් ව්‍යාපාර සඳහා

- හවුල් ව්‍යාපාර ලියාපදිංචි සහතිකය
- ජාතික හුදුනුම්පත (ශ්‍රී ලාංකිකයින් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- ඔප්පුව/කල්බදු ගිවිසුම (ලිපිනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය නම්)

ලියාපදිංචි සමාගම් සඳහා (පුද්ගලික සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්(ලියාපදංචි විදේශ සමාගම්), සීමිත සමාගම්, සිමා රහිත සමාගම්, අක්වෙරළ සමාගම්)

- සංශෝධිත/නව ව්‍යපාර ලියාපදිංචි සහතිකය (ආකෘති පත්‍ර 2ඒ/2ඈ/42/41 යනාදිය)
- සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද ආකෘති පත්‍ර 01 /ආකෘති පත්‍ර 20
- ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලංකිකයන් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශීය ජාතිකයින් සඳහා)
- සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද ආකෘති පත්‍ර 20 යනාදිය
- ආකෘති පත්‍ර 04 (නම යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන්නේ නම්)
- සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ආකෘති පත්‍ර 13 හා ගිවිසුම/කල්බදු ගිවිසුම (ලිපිනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය නම්)

www.ird.gov.lk

අනෙකුත් ආයතන (ව්‍යාපෘති, රාජ්‍ය නොවන සංවිධාන, ඒකක භාර, පුණ්‍යායතන,සමුපකාර සමිති,භාර,සමිති හා සමාජ ශාලා,රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන,තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාල, අර්ථ සාධක අරමුදල් අනෙකුත් විදේශීය සමාගම්- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර නොමැති, අගමික ස්ථාන යනාදිය)

- ආයතන ප්‍රධානියාගේ අයදුම් කිරීමේ ලිපිය
- ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලාංකිකයින් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්) සහ අත්සන් තබන්නාගේ පත් විමේ/ ස්ථිර කිරීමේ ලිපිය
- ගිවිසුම/කල්බදු ගිවිසුම (ලිපිනය යාවත් කාලීන කිරීමට අවශ්‍ය වන්නේ නම්)
- වාර්ෂික මහා සභා රැස්වීම් සටහන්/විධායක වාර්තාව (අදාල වේ නම්)
- සංශෝධිත/නව ලියාපදිංචි සහතිකය
- ප්‍රධාන කාර්යාලය මගින් නිකුත් කරන ලද ශාඛාවේ ස්ථිර කිරීම (ශාඛා සඳහා)
- ආයතනය ස්ථාපිත කිරීමට අදාල පනත/ගැසට් පත්‍රය (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා පමණි.)
- බද්ධ ව්‍යාපාර ගිවිසුම් හා හවුල්කරුවන්ගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකවල ඡායා පිටපත් (බද්ධ ව්‍යාපාර සඳහා පමණි.)
- අත්සන් තබන්නා සඳහා ඇටෝර්නි බලය (බද්ද ව්‍යපාර සඳහා පමණි. ගිවිසුමේ ඇතුළත් කර නොමැති නම්)
- ව්‍යාපෘති ගිවිසුම හා කැබිනට් අනුමැතිය යනාදිය (ව්‍යපෘති සඳහා පමණි.)
- ඒකක භාර (භාර සඳහා පමණි)

www.ird.gov.lk

බදු වර්ග විස්තර යාවත්කාලීන කිරීම

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගෙන බදු වාර්තා සඳහා ලියාපදිංචි වූ පසුව බදු ගෙවන්නාට බදු වර්ග විස්තර දේශීය ආදායම් දෙපර්තමේන්තුවේ ඊ - සේවාවන් මගින් යාවත් කාලීන කළ හැකිය.

ඊ-සේවාවන් තීරය වෙත ප්‍රවේශ වීමට "බදු වර්ග විස්තර තොරතුරු වෙනස් කරන්නේ කෙසේද යන්න" ('How to change Tax Type Detail Information') විස්තරාත්මක ඉක්මන් උපදෙස් බලන්න.

ඊ- මේල් ලිපිනය හා ජංගම දුරකතන අංකය ඇතුළුව බදු ගෙවන්නාගේ ලියාපදිංචි කිරීමේ විස්තර යවත්කාලීන කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී එම විස්තර බදු වර්ග යාවත්කාලීන කිරීම අයදුම් කිරීමට පෙර යාවත්කාලීන කළ යුතුය.

බදු වර්ග සක්‍රිය කිරීම: බදු වර්ගයේ වර්තමාන තත්වය අක්‍රිය නම් හා බැඳියාව නිසා සක්‍රිය කිරීමට අවශ්‍ය වේ.

බදු වර්ග සක්‍රිය කිරීමට අවශ්‍ය වන්නාවූ උපකාරක ලිපි ලේඛන

- එකතු කළ අගය මත බදු නොවන බදු වර්ග සක්‍රිය කිරීම සඳහා බැඳියාව තහවුරු කරමින් ඉල්ලීමේ ලිපිය
- එකතු කළ අගය මත බදු සක්‍රිය කිරීම සඳහා බදු අය කළ හැකි සැපයුම් තහවුරු කිරීමට සනාථ කිරීමේ ලේඛන හා ඉල්ලීම් ලිපිය (විකුණුම් ඉන්වොයිසි/මිලදී ගැනීමේ ඇණවුම/විකිණීමේ ගිවිසුම්/බැංකු ප්‍රකාශ/කුලී ගිවිසුම/ගුවන් ගමන් බිල්පත්/නෞභාර පත්‍රය/බැංකු පිටිසන සමග වානිජ ඉන්වොයිසි/තේ මණ්ඩලයල,පොල් වගා කිරීමේ මණ්ඩලය,මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදි ආයතන වලින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය

බදු වර්ග අක්‍රිය කිරීම: බදු වර්ගයේ වර්තමාන තත්වය සක්‍රිය නම් හා බැඳියාවේ හිඟකම නිසා අක්‍රිය කිරීමට අවශ්‍ය වේ. සියළුම නිකුත් කරන ලද/නිකුත් කිරීමට ඇති වාර්තා බදු වර්ග අක්‍රිය කිරීම ඉල්ලුම් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

බදු වර්ග අක්‍රිය කිරීම සඳහා අවශ්‍ය උපකාරක ලිපි ලේඛන

- අක්‍රිය කිරීමට හේතුව සඳහන් කරමින් ඉල්ලීමේ ලිපිය හා බැඳියාව නොමැති වීම තහවුරු කිරීම සනාථ කිරීමට ලිපි ලේඛන
- තනි පුද්ගලයින්/හවුල් කරුවන්/ අධ්‍යක්ෂවරුන් විසින් ව්‍යාපාර කටයුත්ත වසා දැමීම තහවුරු කිරීම දිවුරුම් දුන් දිවුරුම් ප්‍රකාශයන්
- අදාල අධිකාරියෙන් දෙන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සඳහා සනාථ කිරීමේ ලිපි ලේඛන (සමාගම් රෙජිස්ට්‍රා/ර්පළාත් පාලන)
- පසුගිය මාස 12 සඳහා බැංකු ප්‍රකාශන

www.ird.gov.lk

සරල කරන ලද එකතු කළ අගය මත බදු **(SVAT)** ක්‍රමය යටතේ ලියපදිංචි කිරීම

දැනටමත් එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් පහත දැක්වෙන වර්ගීකරණයන් යටතේ සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි කෙරේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ බදු ලියාපදිංචි කිරීමේ අංශය (2 වන මහල) වෙත පැමිණ හෝ අදාල අයදුම් පත්‍රය හා උපකාරක ලිපි ලේඛන **tr@ird.gov.lk** (එක් PDF ගොනුවකින්) වෙත ඊ- මේල් කර හෝ සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය හැකිය.

1. ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරු (RIS)
2. ලියාපදිංචි හඳුනාගත් මිල දී ගන්නෙකු (RIP)
   - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ **22/7** වගන්තිය යටතේ
   - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනය 11 වන කොටසේ (11) ඊ ඡේදයේ සඳහන් කර ඇති පරිදි **විශේෂ ව්‍යාපෘති** යටතේ
   - 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල 3 (4) වගන්තියේ **ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති** යටතේ
   - ශූන්‍ය ශ්‍රේණිගත සැපයුම්කරුවන් (අපනයනකරුවන්)
   - අපනයනකරුවන් ලෙස සැලකෙන සැපයුම්කරුවන්
   - ඉහත සඳහන් එකක් / වැඩි ගණනක් සඳහා සැපයුම්කරුවන්

සරල කරන ලද එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා 01.01.2016 දින සිට ක්‍රියාත්මක වන පරිදි සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශය බලන්න

SVAT සඳහා ලියාපදිංචිවීමට අවශ්‍ය උපකාරික ලිපිලේඛන

RIS වර්ගීකරණය යටතේ අවශ්‍ය උපකාරික ලිපිලේඛන

- සරල කරන ලද එකතුකළ අගය මත බදු ක්‍රමය (SVAT) සඳහා ලියාපදිංචිය/වෙනස් කිරීම සඳහා අයදුම් පත්‍රය **TRP_006_S**
- සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා අයදුම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය (සමාගම්)/හවුල්කරු/අධ්‍යක්ෂවරයෙක් බලය ලබා දුන් විරුද්ධත්වයක් නොමැති බවට ලිපිය (හවුල් ව්‍යාපාර)
- RIP ලැයිස්තුව සහ ලියාපදිංචි සහතික
- එක් RIP පුද්ගලයෙකුගෙන් මිලදී ගැනීමේ ඇණවුම

www.ird.gov.lk

RIP වර්ගීකරණය යටතේ අවශ්‍ය උපකාරික ලිපිලේඛන

- සරල කරන ලද එකතුකළ අගය මත බදු ක්‍රමය (SVAT) සඳහා ලියාපදිංචිය/වෙනස් කිරීම සඳහා අයදුම් පත්‍රය **TPR_006_S**

- තනි පුද්ගල/හවුල්කරු/අධ්‍යක්ෂකගේ ඉල්ලීම් ලිපිය
- සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා අයදුම් කිරීමට හවුල්කරු/ අධ්‍යක්ෂවරයෙකුට බලය ලබා දුන් විරුද්ධත්වයක් නොමැති බවට ලිපිය (හවුල් ව්‍යාපාර) / අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය (සමාගම්)
- උප ග්‍රන්ථය ඇ (බලයලත් බැර වවුචර පත් අත්සන ඇතුලත් කිරීම්, ඉවත් කිරීම් සහ යාවත්කාලීන කිරීම් සඳහා) **TPR_015_S**
- අයදුම් පත්‍රයේ අත්සන් කරනු ලබන අධ්‍යක්ෂ/හවුල්කරු/තනි පුද්ගලයින් විසින් සහතික කරන ලද බැරපත් වවුචරවල අත්සන් කිරීමට බලයලත් පුද්ගලයින්ගේ අත්සන්
- බැරපත් වවුචර අත්සන් කරන බලයලත් පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලාංකිකයන් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- බැරපත් වවුචර ලබා ගන්නා බලයලත් පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත (ශ්‍රීලාංකිකයින්)වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- අපනයන සංවර්ධන මණ්ඩලය/තේ මණ්ඩලය/පොල් වගා කිරීමේ මණ්ඩලය/මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යනාදිය මගින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය
- ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් (RIS) ලැයිස්තුව හා ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි සහතික
- මිල දී ගැනීමේ ඇණවුම්, ඉන්වොයිසි හා බැංකු ප්‍රකාශන

RIP කාණ්ඩය යටතේ ඉහත ආධාරක ලේඛන වලට අමතරව, 2002 අංක 14 එකතු කළ අගය මත බදු පනතේ 22(7) වගන්තිය යටතේ අවශ්‍ය උපකාරික ලිපිලේඛන

- 22(7) වගන්තිය / විශේෂ ව්‍යාපෘති / උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සඳහා ලියාපදිංචිවීමේ අයදුම්පත්‍රය **TPR_007_S**

- ආයෝජන මණ්ඩලයෙන් (BOI) නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය (අදාල වේ නම්)
- අදාල වේ නම් ආයෝජන මණ්ඩලය (BOI) සමග ඇතිකර ගත් ගිවිසුම්
- ව්‍යාපෘතියේ වටිනාකම සැපයුම් වර්ගය හා අපේක්ෂිත වටිනාකම ව්‍යාපෘතියේ ව්‍යාපාර අරම්භක දිනය ගැන්වී ප්‍රස්ථාරය යනාදිය
- අරමුදල් සපයා ගන්නා ආකාරය සහතික කරන ලද ලියවිලි
- දැනට වැඩ කර ගෙන යන ආකාරය පිළිබඳ වාර්තාවක්
- අපේක්ෂිත මිල දී ගැනීම් ලැයිස්තුව (ආයෝජන මණ්ඩලයේ (BOI) ලියාපදිංචි අස්ථිත්ව සඳහා ආයෝජන මණ්ඩලයේ (BOI) අනුමත කර තිබිය යුතුය.
- දේපලෙහි ඔප්පුව කල් බදු ගිවිසුම
- මිනින්දෝරු සැලැස්ම අදාල පළාත් පාලන අධිකාරියෙන් අනුමත කර තිබිය යුතු අතර ආයෝජන මණ්ඩලයෙන් සහතික කර තිබිය යුතුය.
- අනුමත ගොඩනැඟිලි සැලැස්ම හා ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය දැක්වෙන කටු සටහන
- වරලත් ඉංජිනේරුවරයකු විසින් සහතික කරන ලද ප්‍රමාණ බිල්පත - Bill of quantities (BoQ)
- සංචාරක මණ්ඩලයේ අනුමැතිය (හෝටල් සඳහා පමණි)

www.ird.gov.lk

- අදාල රජයේ දෙපාර්තමේන්තුවේන් ලබා ගත් පාරිසරික වාර්තාව
- කොන්ත්‍රාත් ගිවිසුම (අදාල වේ නම්)

RIP කාණ්ඩය යටතේ ඉහත ආධාරක ලේඛන වලට අමතරව, විශේෂ ව්‍යාපෘති යටතේ අවශ්‍ය උපකාරික ලිපිලේඛන

- 22(7) වගන්තිය / විශේෂ ව්‍යාපෘති / උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සඳහා ලියාපදිංචිවීමේ අයදුම්පත්‍රය **TPR_007_S**

- අදාල අමාත්‍යාංශයෙන් ලබා ගත් අනුමැතිය/අදාල අමාත්‍යාංශයේ ලේකම් අත්සන් කළ ලිපිය
- ලේකම් ශාඛාව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි ලිපිය

RIP කාණ්ඩය යටතේ ඉහත ආධාරක ලේඛන වලට අමතරව, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යපෘති යටතේ

- 22(7) වගන්තිය / විශේෂ ව්‍යාපෘති / උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සඳහා ලියාපදිංචිවීමේ අයදුම්පත්‍රය **TPR_007_S**

- ගැසට් නිවේදනය/ අදාල අමාත්‍යාංශයේ අනුමැතිය/අදාල අමාත්‍යාංශයේ ලේකම් අත්සන් කළ ලිපිය
- ලේකම් ශාඛාව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි ලිපිය

www.ird.gov.lk

සරල කරන ලද එකතු කළ අගය මත බදු **(SVAT)** විස්තර යාවත්කාලීන කිරීම

සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවාදායක තොරතුරු යාවත්කාලීන කිරීමේ අංශය (2 වන මහල) වෙත පැමිණ හෝ අදාල අයදුම් පත්‍රය හා ලිපි ලේඛන විද්‍යුත් තැපෑල **ci@ird.gov.lk** (එක් PDF ගොනුවකින්) වෙත ඊ- මේල් කිරීමෙන් යාවත්කාලීන කළ හැකිය.

පහත දැක්වෙන පුද්ගලයින් විසින් අයදුම් පත්‍රය හා උපකාරක ලිපි ලේඛන අත්සන් කළ යුතුය.

- සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතියකින් බලය පවරන ලද අධ්‍යක්ෂකවරයෙක්
- සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා අයදුම් කිරීමට විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ලබා ගත් හවුල්කරුවකු
- තනි පුද්ගලයෙකු

අධ්‍යක්ෂවරයෙකු/හවුල්කරුවෙකු වෙනස් කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක දී අලුත් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතියක් /විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

SVAT විස්තර යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපකාරක ලිපි ලේඛන

- ඉහත සඳහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතියේ පිටපතක් / විරුද්ධත්වයක් නොමැති බවට ලිපිය (අදාල නම්)
- සරල කරන ලද එකතුකළ අගය මත බදු ක්‍රමය (SVAT) සඳහා ලියාපදිංචිය/වෙනස් කිරීම සඳහා අයදුම් පත්‍රය **TRP_006_S**
- උප ග්‍රන්ථය ඇ (බලයලත් බැර වවුචර පත් අත්සන ඇතුලත් කිරීම්, ඉවත් කිරීම් සහ යාවත්කාලීන කිරීම් සඳහා) **TPR_015_S**
- අයදුම් පත්‍රයේ අත්සන් කරනු ලබන අධ්‍යක්ෂ/හවුල්කරු/තනි පුද්ගලයින් විසින් සහතික කරන ලද බැරපත් වවුචරවල අත්සන් කිරීමට බලයලත් පුද්ගලයින්ගේ අත්සන්
- බැරපත් වවුචර අත්සන් කරන බලයලත් පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත (ශ්‍රී ලාංකිකයන් සඳහා)/වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)
- බැරපත් වවුචර ලබා ගන්නා බලයලත් පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත (ශ්‍රීලාංකිකයින්)වලංගු විදේශ ගමන් බලපත්‍රය (විදේශ ජාතිකයින්)

www.ird.gov.lk

ව්‍යාපෘති විස්තර යාවත්කාලීන කිරීම

පහත විස්තර වර්ගීකරණය යටතේ ලියාපදිංචි කළ ව්‍යපෘති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවාදායක තොරතුරු යාවත්කාලීන කිරීමේ අංශය (2 වන මහළ) වෙත පැමිණීමෙන් හෝ අදාල ඉල්ලුම් පත්‍රය හා උපකාරක ලිපි ලේඛන ci@ird.gov.lk (එක් PDF ගොනුවකින්) විද්‍යුත් ලිපිනයට ඊ - මේල් කිරීමෙන් යාවත්කාලීන කළ හැකිය

- 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ **22(7)** වගන්තිය යටතේ
- 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ 11 වන කොටසේ 11(ඊ) පරිච්ඡේදයේ සඳහන් කර ඇති **විශේෂ ව්‍යපෘති** යටතේ
- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති වල 3(4) වගන්තියේ **ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති** යටතේ

වර්තමාන කාලය දිගු කිරීමේ දිනයේ සිට දින 14 කට පෙර අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එයට අමතරව, කලින් කාලය දිගු කිරීමේ කාලය තුල දී පනවා තිබූ යම් කොන්දේසියක් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර සම්පූර්ණ කළ යුතුය. පහත දැකවෙන පුද්ගලයින් විසින් පමණක් ඉල්ලුම් පත්‍රය හා උපකාරක ලිපි ලේඛන අත්සන් කළ යුතුය.

- සරල කරන ලද එකතු කළ අගය මත බදු සඳහා අයදුම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සම්මුතියෙන් බලය ලත් අධ්‍යක්ෂකවරයෙකු
- සරල කරන ලද එකතු අගය මත බදු සඳහා අයදුම් කිරීමට විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ලබා ගත් හවුල් කරුවෙකු
- තනි පුද්ගලයින්

අධ්‍යක්ෂකවරයා/හවුල්කරු වෙනස් කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක දී, අලුත් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයන්/ විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ඉදිරිපත් කිරීම අවශ්‍යය.

විශේෂ ව්‍යාපෘති යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපකාරක ලිපි ලේඛන

- 22(7) වගන්තිය / විශේෂ ව්‍යාපෘති / උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සඳහා ලියාපදිංචිවීමේ අයදුම්පත්‍රය **TPR_007_S**
- අදාල අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද දිර්ඝ කිරීමේ ලිපිය
- ලේකම් ශාඛාව විසින් නිකුත් කරන ලද ලිපිය

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපකාරක ලිපි ලේඛන

- 22(7) වගන්තිය / විශේෂ ව්‍යාපෘති / උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සඳහා ලියාපදිංචිවීමේ අයදුම්පත්‍රය **TPR_007_S**
- අදාල අමාත්‍යාංශයෙන් නිකුත් කළ දිර්ඝ කිරීමේ ලිපිය/ගැසට් නිවේදනය
- ලේකම් ශාඛාව විසින් නිකුත් කරන ලද ලිපිය

For further details call IRD Call Centre on 1944

www.ird.gov.lk

22(7) ව්‍යාපෘති යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය වන උපකාරක ලිපි ලේඛන

- 22(7) වගන්තිය / විශේෂ ව්‍යාපෘති / උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සඳහා ලියාපදිංචිවීමේ අයදුම්පත්‍රය **TPR_007_S**

- අලුත්/යාවත්කාලීන කිරීම 22(7) /SP/ SDP ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍රය TPR 007 E
- අධ්‍යක්ෂකවරයා විසින් සහතික කරන ලද ඡායාරූප සමඟ ප්‍රගති වාර්තාව
- අධ්‍යක්ෂවරයා විසින් සහතික කරන ලද පුර්ව දිර්ඝ කිරීමේ කාලයේ සිට බැංකු ප්‍රකාශන
- නියම කරන ලද ආකෘතියේ දරන ලද වියදම්
- ද්‍රව්‍යමය ප්‍රතිසන්ධාන ප්‍රකාශය
- අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද කොන්ත්‍රාත් ගෙවීම්
- ආනයන/දේශීය මිල දී ගැනීම්/සරල කරන ලද එකතු කරන ලද අගය මත බදු මිල දී ගැනීම් සඳහා උපලේඛන
- සංශෝධිත ව්‍යපෘති යෝජනා/අතිරේක BOQ අදාල වේ නම්
- ආයෝජන මණ්ඩලය සමග එලඹී ඇති පරිපුරක ගිවිසුම්/ආයෝජන මණ්ඩලය මගින් නිකුත් කළ ලිපි අදාල වේ නම්
- පෙර දිර්ඝ කිරීමේ කාලය තුල දී ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටි අනෙකුත් ලිපි ලේඛන

www.ird.gov.lk